# ඉදල් ඉරිඟු

## අපේ කෑමවේලට තවත් වැදගත් අතිරේක බෝගයක්

බත්, කිරිබත්, කැවුම්, කොකිස් වැනි අපේ ගතානුගතික දේශීය ආහාර වර්ග පිළියෙළ කිරීමේදී මෙතෙක් කල් බොහෝ විට අප පාවිච්චි කළේ සහල්ය. බත් වෙනුවට වෙනත් ආහාර වර්ග ගැනීමටත් එවැනි ආහාර බෝග වගා කිරීමටත් කාගේත් පාහේ උනන්දුව ඇතිවී තිබෙන මේ යුගයේ දී තවත් වැදගත් අතිරේක ආහාර වර්ගයක් වූ ඉදල් ඉරිඟු වගාව කෙරෙහි අපරට ජනතාව තුළ ඇතිවී තිබෙන උනන්දුව කෙරෙහි සිත් යොමු කිරීම වටනේය.

ඉදල් ඉරිඟු වගාවේ මෑත කාලීන දියුණුව විදහා පාන එවන් තැනක් නැරඹීමටත් මෙම බෝග පිළියෙළ කරන ලද නානාවිධ රසවත් කැවිලි වර්ග වල රස බැලීමටත් අවස්ථාවක් පසුගිය දා ලැබුණි.

කෘෂිකම් අධ්‍යක්ෂ ආචාර්ය ටී. අබේරත්න මහතා හා කුරුණෑගල දිසාපති චන්ද්‍රානන්ද ද සිල්වා මහතා ඇතුළු රජයේ නිලධාරීන් හා අවට වතු හිමියන්ගේ සහභාගිත්වයෙන් මේ පිළිබඳ ක්ෂේත්‍ර දිනයක් පසුගියදා පවත්වන ලදී.

මෙම ක්ෂේත්‍ර දිනය පවත්වන ලද්දේ කුරුණෑගල පොල්පිතිගම කෘෂිකම් උපදේශක කොට්ඨාශයේ ඇස්. කේ. ගුණවර්ධන මහතාගේ මහවෙල වත්තේදීය. කෘෂිකම් දෙපාර්තමේන්තුවේ සේවයෙන් විශ්‍රාම ගත් ගුණවර්ධන මහතා විවිධ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්හදාබැලීම් කර ඒවා තම වත්තේ සාර්ථක ලෙස ක්‍රියාත්මක කරගෙන යන අයෙකි. ඉඩමෙන් උපරිම ප්‍රයෝජන ගැනුමත්, ජාතික ආහාර වගා ව්‍යාපාරයට අත දීමත් පරමාර්ථ කොටගත් ඒ මහතා තමන් සතු පොල් වත්තේ අක්. 10 ක පමණ ඉදල් ඉරිඟු වගාව ඇරඹීය.

කෘෂිකම් උපදේශක (ලෝක ආහාර) අබේසිංහ මහතාගේ උපදෙස් පිට අරඹන ලද මෙම වගාව පොල් ගස් යට අතුරු වගාවක් වශයෙන් කර ඇති නමුත් දැනට සාර්ථකව පවතී. වෙනත් සරවත් ඉදල් ඉරිඟු වගාවකුත් මේ වගාවත් අතර වෙනසක් කිව නොහැකිය. අවශ්‍ය බීජ අබේසිංහ මහතා විසින් සපයන ලද අතර 1973 මැයි 15 වැනිදා ඒවා පේළියට දමන ලදී. රසායනික පෝර යෙදීම, කෘමි රෝග මර්දනය සහ වල් මර්දනය ක්‍රමවත්ව කර ඇත. පොල්පිතිගම කෘෂිකම් උපදේශක පී. ආර්. පුංචිබණ්ඩා මහතාත් මඩහපොල කෘෂිකම් ව්‍යාප්ති සේවක ජී. පුංචිබණ්ඩා මහතාත් නිතර පැමිණ වගාවට අවශ්‍ය උපදෙස් සපයති.

කුරුණෑගල පෙදෙසේ පොල්වගාවන්හි සාර්ථක ලෙස කළ හැකි මෙම වගාව කෙරෙහි අනිකුත් අවට වතු හිමියන්ගේද විශේෂ සැලකිල්ල යොමුවී ඇති අතර, ඔවුන්ද නුදුරු අනාගතයේදී ඉදල් ඉරිඟු වගාව අරඹන බවට සැකයක් නැත.

මෙතෙක් කල් ඉදල් ඉරිඟු සත්ව ආහාරයක් වශයෙන් ප්‍රසිද්ධියක් ලද වුවද මනුෂ්‍ය ආහාරයක් වශයෙන්ද පාවිච්චි කළ හැකි බැව් ගුණවර්ධන මහතා පෙන්වා දුන්නේය. ක්ෂේත්‍ර දිනයේදී එයින් සාදන ලද විවිධ කැවිලි වර්ග වල රස බැලූ හැම දෙනාට එය මැනවින් හෙළිවිය.

බත් කෑමෙන් පමණක් ජීවත්වීමට තිබුණු පුරුද්ද වෙනුවට වෙනත් ආහාර වර්ග ද ආහාරයට ගැනීමට මෙන්ම නිපදවීමට ද වෙහෙසෙන මේ යුගයේදී ඉදල් ඉරිඟු වැනි බෝගයන් වගා කිරීමට දරණ ප්‍රයත්නය ඉතා වැදගත්ය. එය අපේ ජාතික ආහාර වගා ව්‍යාපාරයේ සාර්ථකත්වය පිළිබඳ තවත් සුබ ලකුණක් හැටියට හැඳින්විය හැක.